# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DMA/P/2015/8-3

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2016 .06 10

කළමණාකරණ විගණන චක්‍රලේඛ 02/2016

සියළු අමාත්‍යාංශ ලේකම්වරු, පළාත්සභා ප්‍රධාන ලේකම්වරු

දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සහ රාජ්‍ය සමාගම්වල සභාපතිවරු

__විදේශාධාර පාදක සංවර්ධන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරු පත්කිරීම__

විදේශාධාර පාදක සංවර්ධන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණකවරයකු ඇතුලත් නොවීම නිසා ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන සංරචකයක් වන විදේශාධාර ව්‍යාපෘති නිසි අභ්‍යන්තර පාලනයකට නතුකර ගැනීම ගැටළුවක්ව ඇත. මේ නිසා රාජ්‍ය මූල්‍ය කළමණාකරණයේදී සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රතිලාභ නියමිත ප්‍රමාණයෙන් අප්‍රමාදව පොදු ජනතාවට ලැබීම සහතික කිරීමට හා විනිවිදභාවය තහවුරු කිරීමට බාධාවක් ලෙස පවතී.

එසේ හෙයින් කළමණාකරණ සේවා චක්‍රලේඛ 1/2016 හි 1.1, 1.2, හා 1.3 යන උප වගන්ති වලින් විස්තර කෙරෙන හා ව්‍යාපෘති මුළු පිරිවැය ඇ.ඩො. මිලියන 10 ක් හෝ ඊට වැඩි ව්‍යාපෘතීන් සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කිරීමට කටයුතු කල යුතුව ඇත. ඒ අනුව,

1. නව ව්‍යාපෘති සඳහා එකී චක්‍රලේඛය පරිදි පූර්ව ව්‍යාපෘති ඇගයුම් අධියරේදී අභ්‍යන්තර විගණකවරයකු ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ඇතුලත් කළයුතුය.
2. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන්ගේ ඉදිරියට ඇති ව්‍යාපෘති කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩිවන අවස්ථාවක එම ව්‍යාපෘතිය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතිය ඇතිව අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීමට අප්‍රමාදව ක්‍රියා කළයුතුය.